00115

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - (1 වන අදියර) 2023
**STP8209/STP8308/ESP2108** - අධ්‍යාපන කළමනාකරණය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I වන කොටසේ <u>සියලුම</u> ප්‍රශ්න වලටද II වන කොටසින් ඕනෑම ප්‍රශ්න <u>තුනකටද (03)</u> පිළිතුරු සපයන්න.

## <u>I වන කොටස</u>

01. "කළමනාකරණය යනු අරමුණු සහිත ක්‍රියාකාරකමකි. එය කලින් තීරණය කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කණ්ඩායම් උත්සාහයන් මෙහෙයවන දෙයකි."

කළමනාකරන සංකල්පය සුදුසු නිර්වචනයකින් පැහැදිලි කරන්න.

02. "අධ්‍යාපන ආයතනවල පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා ඵලදායී කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. "

උදාහරණ තුනක් (03) සමඟ මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "කාර්යක්ෂමතාව" සහ "ඵලදායීතාව" යන සංකල්ප පාසල් සංදර්භයේ උදාහරණ සහිතව වෙන්කොට දක්වන්න.

04. "සංවිධාන විවෘත පද්ධති ලෙස සලකනු ලැබේ. එකී සංවිධාන සඳහා අදාළ පරිසරයේ බලපෑම සෘජුවම එල්ල වේ." සංවිධානයක් ලෙස පාසලක සඵලතාවය ඇගයීම සඳහා කළමනාකරණ පද්ධති න්‍යාය (System Theory) යොදා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. "පාසලක විදුහල්පතිවරයෙකු ඵලදායී අධ්‍යාපන සංවර්ධන නායකයෙකු සහ වෙනස්වීම් කාරකයෙකු ලෙස සලකනු ලැබේ." ඵලදායී විදුහල්පතිවරයෙකුගෙන් අපේක්ෂා කරනු ලබන නායකත්ව ගුණාංග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. "ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යාපන කළමනාකරණය සහ පරිපාලනය භාරව සිටී." ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් තුනක් (03) සඳහන් කරන්න.

07. "සියලු අරමුණු සාක්ෂාත් කර ගන්නා පාසලක් ඵලදායී පාසලක් ලෙස හැඳින්වේ." ඵලදායී පාසල් හඳුනා ගැනීම පහසු කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති නිර්ණායක හතර (04) සඳහන් කරන්න.

08. "අධීක්ෂණය ඉගැන්වීම් -ඉගෙනීමේ ක්‍රියාවලියේ සඵලතාවය ඇගයීමට සහ නියාමනයට අවැසි උපාය මාර්ගයක් සපයයි." පාසල් අධීක්ෂණය සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු මූලික මූලධර්ම පහක් **(05)** සඳහන් කරන්න.

( ලකුණු 05 x 08 = 40 )

## II වන කොටස

09. (i) සංවිධානයක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) සංවිධානයක දැක්ම හා මෙහෙවර අතර වෙනස දක්වන්න. (ලකුණු 06)

(iii) සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා ඕනෑම ආයතනයක් විසින් සපුරාලිය යුතු අංග තුනක් **(03)** සඳහන් කර, සුදුසු උදාහරණ සමග තෝරාගත් එක් **(01)** අංගයක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. "සැලසුම්කරණය කළමනාකරණයේ පළමු මෙන් ම තීරණාත්මක කාර්යය වන අතර, කළමනාකරණයේ අනෙකුත් සියලුම කාර්යයන් සඳහා පදනමක් ලෙස සැලකේ."

(i) සැලසුම්කරණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) සැලසුම්කරණ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන පියවර හතර **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සැලසුම්කරණ ක්‍රියාවලිය තුළ පාසල් මට්ටමේ සැලසුම්කරුවන් මුහුණ දෙන ඕනෑම ගැටලු/අභියෝග තුනක් **(03)** සඳහන් කර එම ගැටලු/අභියෝග අවම කිරීමට/ජය ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11. "සම්භාව්‍ය සංවිධාන න්‍යායවාදීන් සේවකයන්ගේ ඵලදායීතාව සහ වැටුප් කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ අතර, සේවකයින්ගේ මනෝ සමාජීය අවශ්‍යතා කෙරෙහි අඩු අවධානයක් යොමු කළ හ."

(i) මෙම ප්‍රකාශය කෙටියෙන් සාධාරණීකරණය කරන්න. (ලකුණු 05)

(ii) බ්ලේක් හා මවුටන් හඳුන්වා දුන් කළමනාකාරිත්ව ජාලය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) බ්ලේක් හා මවුටන් විසින් හඳුන්වා දුන් කළමනාකරණ ජාලයට අනුව, "Style 9.9" ( කණ්ඩායම් කළමනාකරණය) යනු හොඳ කළමනාකරුවෙකු සඳහා හොඳම ශෛලියයි. මෙම ශෛලිය තුළ කළමනාකරුවෙකුගේ භූමිකාවන් පහක් **(05)** සඳහන් කරන්න.

(ලකුණු 10)

12. (i) පාසල් විදුහල්පතිවරුන්ට අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණුව අත්‍යවශ්‍ය වන්නේ ඇයි? (ලකුණු 06)

(ii) පාසල් විදුහල්පතිවරුන් සඳහා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණුවක දී සැලකා බැලිය යුතු වැදගත් ක්ෂේත්‍ර හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පාසල් විදුහල්පතිවරුන් සඳහා අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දීමෙන් අධ්‍යාපන පද්ධතියට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් **(04)** සඳහන් කර, සුදුසු උදාහරණ සමඟින් එක් ප්‍රතිලාභයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. " නායකත්වය බොහෝ විට සම්බන්ධ වන්නේ දර්ශනය සමඟින් වන අතර, එය නායකයින් සහ ඔවුන්ගේ සංවිධාන සඳහා අත්‍යවශ්‍ය මඟ පෙන්වීමක් සපයයි."

(i) නායකත්වය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) 21 වන සියවසේ පාසල් නායකයින් සඳහා පරිවර්තනීය නායකත්ව භූමිකාව ඉතා වැදගත් වේ. පරිවර්තනීය නායකත්වයේ ලක්ෂණ හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඵලදායී නායකයකු වීම පිළිබඳ දේශනයක් සඳහා ආරාධනා කළහොත් එහි දී ඔබ අවධාරණය කරන්නේ මොනවා ද? (ලකුණු 08)

14. "අධ්‍යාපන කළමනාකරණයේ ගැටලු අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සෘජුවම බලපායි. "

(i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු/මතවාද හතරක් **(04)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ මෙවැනි ගැටලු මතුවීමට බලපාන සාධක හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහත සඳහන් කළ (13 (i) එවැනි ගැටලුවක්/මතවාදයක් තෝරාගෙන පාසල් කළමනාකරණයට එහි බලපෑම විශ්ලේෂණය කර ගැටලුව/මතවාදය විසඳීමට ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.